## දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය 2020 - සිංහල I

## පිළිතුරු පත්‍රය - I

### I පත්‍රය

01. (අ) (i) ගල මුදුනේදී කුණ්ඩලකේසී මරා ඈ සතු ආබරණ ලබාගන්නා අදහසින්.
(ii) සැමියාගේ ඉල්ලීමට අනුව දේව පූජා වස්තු සියල්ලම කුණ්ඩලකේසී විසින් රැගෙන යාම.
(iii) 'මට බලි කර්මයෙන් පලක් නැත. බලි කර්මය පිට දමාලා නුඹ මෙම ස්ථානයට ගෙන්නා ගැනීම පිණිසය.
(iv) පිදිය යුතු දේ බලි කර්මයකදී පූජාව සඳහා යොදා ගන්නා පූජා ද්‍රව්‍ය සහිත වට්ටිය. (පූජා භාණ්ඩ)

(ආ) (i) වංචා කරනනිසා මායා රූපයක් වැනිය. ඇදහිය නොහැකි නිසා මිරිඟු ජලයක් වැනි ආදී....
(ii) පරලොව අපාදුක් විඳීම පමණක් නොවන මෙලොව දී කරදර විඳ මරණයට පත්වීම.
(iii) කාමුක මිනිසුන් බැඳ ගැනීමට මාරයා විසින් මැවුවා වූ මර උගුලක් වැනිය.
(iv) හිරු එළිය දැඩිව පවතින මොහොතක ඈතින් දිස්වන ජලය සේ පෙනෙන දෘෂ්ටි මායාව.

(ඉ) (i) හී දඬු පන්සියයෙන් එකක් ගෙන වාතය සහිත කුම්භස්තලයට විද
(ii) සතුන් මරා මස් පුළුස්සා කන මිනිසුන් ඉන්නා ස්ථානයට ගොස් දඩමස් ඉල්ලාගෙන එන ලෙසයි.
(iii) වාතය සහිත හිස මුදුනට විද හස්තියා එම ස්ථානයෙහිම මරණයට පත්කොට
(iv) දුන්න, මුගුර, අඩයටි, පත්කොහොල්, පාරාවළල්ල යන අවි පහකින් සමන්විත

(ඊ) (i) සක්විති රජවරු ඉපදීම, අපමණ ධන සම්පත් ඇති සිටුවරු සිටීම, දහ අට කෝටියක් ධනය සහිත වංශවතුන්ගෙන් සෝබමාන වීම.
(ii) නගර සෝභිනියක්/වෙසඟනක් නොසිටීම නිසා.
(iii) 'රන් ආබරණ හා පිරිවර සෙනඟ හා උද්‍යාන පොකුණු, බත් උපදනා ගම් (නින්දගම්) ආදී වූ විවිධ සම්පත් ද මහල් හතක් සහිත මහා ප්‍රාසාදයක්ද'..
(iv) සක්විති රජුන්, (අහසින් ගමන් කිරීමේ මහා බලයක් සහිත චක්‍ර රත්නය පහළ වූ, සතර මහා ද්වීපයටමඅනුශාසනා කරන රජු)

(උ) (i) සිතෙහි ඇතිවන දොම්නස සන්සිඳුවා ගැනීමටත් ලෝභය/ආශාව වර්ධනය වීමත්ය.
(ii) ශරීර ලක්ෂණ බලා දුදන ගති ඇති බව දැනගත් නිසාය.
(iii) දොම්නසෙහි මුල් උදුරා දැමූ ලෝභය නැමැති වැල ලියලන්නා වූ
(iv) බෝධිසත්වයන්/බුදු බව අරමුණු කරගනිමින් සමතිස් පාරමිතා ධර්ම සපුරා ගන්නා උත්තමයන් වහන්ස.

(ඌ) (i) 13 වන සියවසෙහි දඹදෙනි යුගයේ විසූ ධර්මසේන හිමිපාණන් විසින් රචිත සද්ධර්ම රත්නාවලියේ මට්ටකුණ්ඩලී කතා වස්තුවේ එන පාඨයකි.
අදින්න පුබ්බක බමුණාට මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයා පෙන්වමින් දහම් දේශනා කළ අවස්ථාවේ බුදුන් වහන්සේ විසින් අදින්න පුබ්බක බමුණාට පවසන ලද්දකි.

(ii) 13 වන සියවසෙහි දඹදෙණි යුගයේ විසූ මයුරපාද පිරිවෙන්පති බුද්ධපුත්‍ර හිමියන් විසින් රචිත පූජාවලියෙහි අනුරුද්ධ කුමාර කතා වස්තුවෙන් උපුටාගත් පාඨයකි.
අනුරුද්ධ කුමරු ඇතුළු පිරිස බුදුන් වහන්සේ මුණ ගැසී උපාලි කපුවා පළමුව පැවිදි කරන්නැයි ආයාචනා කළ අවස්ථාවේ බුදුන් වහන්සේ විසින් ශාක්‍ය කුමරුන්ට පැවසූවකි.

(iii) 14 වන සියවසේ කුරුණෑගල යුගයේ බහුකර්තෘ මණ්ඩලයක් විසින් සම්පාදිත පන්සියපනස් ජාතක පොතෙන් උපුටා ගන්නා ලද, චන්න කින්නර ජාතකයේ එන පාඨකයකි.
කිඳුරියගේ විලාප අසා පිහිටවීමට ශක්‍රයා පැමිණ කිඳුරු ස්වාමියා සුවපත් කළ අවස්ථාවේ කිඳුරිය විසින් ශක්‍රයා අමතා මෙම ප්‍රකාශය කියන ලද්දකි.

(iv) 14 වන සියවසේ ගම්පොළ යුගයේ විසූ දෙවන ධර්මකීර්ති හිමියන් විසින් රචිත සද්ධර්මාලංකාරයෙන් උපුටාගන්නා ලද පාඨයකි.
මුහුදු රළ මඩිමින් එන උදක රාක්ෂයා දැක බියට පත්වූ නැවේ සිටි මිනිසුන් කෑ ගසන හඬ ඇසෙන අවස්ථාවේ නන්දිය වෙළෙන්දා විසින් තම පිරිසගෙන් විමසන ලද්දකි.

(v) රන්ජිත් ධර්මකීර්ති මහතා විසින් රචිත 'හරස්පාර' නම් කෙටිකතා සංග්‍රහයේ ඇතුළත් 'කවියෙකුට අත්දැකීමක්' නැමැති කෙටිකතාවෙන් උපුටා ගත්තකි.
බස් රථයට නැගි බීමත් පුද්ගලයා විසින් බස් රථයේ ගමන් ගත් මගීන්ට බස් රථයේ ගමන් කරන අවස්ථාවේදී ප්‍රකාශ කරන ලද්දකි.

(vi) ලෙනාඩ් වුල්ෆ් මහතා විසින් රචිත 'ද විලේජ් ඉන් ද ජංගල්' කෘතිය, ඒ.පී ගුණරත්නයන් විසින් බැද්දේගම නමින් සිංහලයට පරිවර්තනය කළේය. එම නවකතාවෙන් උපුටා ගත් ප්‍රකාශයකි.
ගමට පැමිණිදාට පසුදා හින්නිහාමි බැලීමට සිලිඳු ගිය අවස්ථාවේදී හින්නිහාමි විසින් සිලිඳු වෙත ප්‍රකාශ කරන ලද්දකි.

(vii) එදිරිවීර සරත්චන්ද්‍රයන් විසින් රචිත පේමතෝ ජායතී සෝකෝ' නාට්‍යයේ ඇතුළත් ප්‍රකාශනයකි.
උද්දාල බමුණාගේ වෙනස්වීම පිළිබඳව සිසුන් කථාබහ කරන අවස්ථාවේදී ගුරුතුමා මීට පෙර කී වදනක් පිළිබඳව යළි මතක් කරමින් දප්පුල විසින් කළ ප්‍රකාශයේදී අග්ගිදත්ත විසින් දප්පුලට මෙසේ කියන ලදී.

*** අංක 02 සිට 08 දක්වා ප්‍රශ්නවල අන්තර්ගතයට ගැළපෙන ලෙස පිළිතුරු ලබාදී ඇත්නම් ඒ සඳහා සුදුසු ලකුණක් ප්‍රදානය කරන්න. මෙහිදී ගුරු මාර්ගෝපදේශයේ ඇතුළත් කරුනු කෙරෙහි විශේෂ අවධානය යොමු කරන්න.**

## පිළිතුරු පත්‍රය II

## I කොටස

## II පත්‍රය

01.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1.1 | 2 | 1.6 | 3 | 1.11 | 5 | 1.16 | 3 |
| 1.2 | 2 | 1.7 | 1 | 1.12 | 4 | 1.17 | 4 |
| 1.3 | 2 | 1.8 | 2 | 1.13 | 3 | 1.18 | 4 |
| 1.4 | 1 | 1.9 | 2 | 1.14 | 5 | 1.19 | 5 |
| 1.5 | 1 | 1.10 | 2 | 1.15 | 1 | 1.20 | 4 |

02. (අ)
(i) පතිදම් රැකීම හෝ පතිභක්තිය උසස් කොට නොසැලකූ සෙල්ලක්කාර තරුණියක ලෙස.
(ii) උඩරට පළාත්වල ආඬි බලය අධික වූ කාලයේ ඔවුන් නින්දාවට හා සමච්චලයට ලක් කිරීම.
(iii) ආඬි නම් බ්‍රාහ්මණ පිරිස.
(iv) විදේශිකයන් සමඟ වුවද සාමකාමී සහජීවනයෙන් ජීවත් විය යුතු බව.
(v) ආඬි ගුරු, ඔහුගේ බිරිඳ, අප රටේ වට්ටෝරු වෙදුන්, ආණ්ඩුවේ නිලමේවරු.
(vi) ගමට රටට සශ්‍රීකත්වය ළඟා කර දෙන සෙනෙහෙබර මාතාවක් බවට පත්කොට ඇය පත්තිනියගේ ම අවතාරයක් සේ සැළකීම.

(ආ)
- අලුත් අවුරුද්ද හා බැඳුණු සිරිත් විරිත් වසර දහස් ගණනක සිට උරුම වූ සංස්කෘතියක් බව
- නව අවුරුදු සංස්කෘතිය තුළ දේශීය වෛද්‍ය ක්‍රම යහගුණ සෞඛ්‍ය ආරක්ෂිත සිරිත් විරිත් ආදිය ඇතුළත් බව.
- සුබ නව වසර ලෙස අදහස් කරන්නේ සූර්යයා මීන රාශියෙන් මේෂ රශියට ප්‍රවේශ වන බවයි.
- හිරු මේෂ රාශි ගත වීමේ දී ජෛවීය හා පාරිසරික වෙනස්කම් ද කාලගුණික වෙනස්වීම් ද සිදුවන බවයි.
- අවුරුදු නැකත් ආයුර්වේද නියමයට අනුව ගොඩනැගෙන බව.
- චාරිත්‍ර වාරිත්‍ර සුරැකීම තුළින් නිරෝගී බව, ගුණගරුක බව, විනීත හා සංවර්ධනශීලී ජනතාවක් බිහිවන බවයි.

ඉහත කරුණු ගැන අවධානය යොමු කරමින් ලකුණු පිරිනමන්න.
වචන සංඛ්‍යාව - 2, ශිල්පීය දක්ෂතා - 3 , අන්තර්ගතය - 8 ලකුණු 13

03. මාතෘකානුකූලව ඇතුළත් කරුණු කෙරෙහි සැලකිලිමත් වෙමින් ලකුණු ප්‍රදානය කරන්න. ලකුණු 25

NMP EXAM

04. (අ) (i) තරුකැල නිල් අහස්තලය අලංකාර කරයි.
(ii) ඔහු ද මම ද මිනිසා ද ගමට ගියෙමු.
(iii) ඈ දෙවඟනක මෙන් රූමත් ය.
(iv) නිවැරදි වාක්‍යය
(v) දරුවන් නාට්‍ය බලනවා නම් දෙමාපියෝ සතුටු වෙති.

(ආ) (i) ජනාධිපතිතුමා විසින් ඇමතිවරු ඇගයීමට ලක් කෙරෙත් / ලක්කරනු ලබති. / කෙරෙති.
(ii) සිංහයන් විසින් මුවදෙනක් අල්ලා ගැනුණාය / ගැනිණි / ගන්නා ලද්දීය / ගනු ලැබුවාය.
(iii) කස්කරුවා විසින් ලොරියට වැලි පැටවෙයි / පටවනු ලබයි / පැටවේ.
(iv) පියාණන් විසින් අපි සැනසුණුමු / සනසනු ලැබූමු / ලැබීමු.
(v) බැතිමතුන් විසින් බුද්ධ පූජාවෝ කෙරෙත් / කෙරෙති / කරනු ලබති.

(ඇ) (i) ශිෂ්‍යයන් - වූහ (ii) සමහරෙක් - ගයති
(iii) නායකයන් - සිතති (iv) රජවරු - සාදවති
(v) ඊතුමූ - ඇමතුහ / ඊතොමෝ - ඇමතුවාය

05.

| | | වචනය | අංගය | අනුඅංගය |
|---|---|---|---|---|
| 05. | (i) | සැරද | ක්‍රියාපද | ආශිර්වාද ක්‍රියා |
| | | පරෙවිදු | සන්ධි පද | පර ස්වර ලෝප සන්ධිය |
| | | සුරත් | අව්‍ය පද | උපසර්ග |
| | (ii) | ලෙසේ | නිපාත පද | උපමාවාචී නිපාත |
| | | නාදනූ | සන්ධි පද | පර ස්වර ලෝප සන්ධිය |
| | | තබ තබා | ක්‍රියා පද | මිශ්‍ර ක්‍රියා |
| | (iii) | මලගෙටියෙන් | විභක්ති පද | ආධාර විභක්ති |
| | | පොවමින් | ක්‍රියා | මිශ්‍ර ක්‍රියා |
| | | අතිනතින | සන්ධි | ස්වර සන්ධි |
| | (iv) | වැදගත් | ක්‍රියා පද | විධි ක්‍රියා |
| | | මිතුර | විභක්ති | ආලපන විභක්ති |
| | | තුන්සිත | සමාස පද | සංඛ්‍යා පූර්ව විශේෂණ සමාස |
| | (v) | නූතන | තද්ධිත පද | කාලාර්ථයේ නිපාත |
| | | දේශානුරාගයෙන් | සන්ධි | සමාන ස්වර දීර්ඝ |
| | | අලංකාරවත් | තද්ධිත පද | අස්ථ්‍යාර්ථයේ නිපාත |

06. (අ) (i) පතළ (ii) ආශ්චර්යය (iii) පතල (iv) තරග
(v) ඓශ්වර්යය (v) තරඟ

(ආ (i) සාතිශය (ii) මහනුවම් (iii) මහොර (iv) බුත්සරණ (v) මුදලිඳු

(ඉ) (i) දෙගුරුන් විසින් - කර්තෘ විභක්තිය, දරුවන්ට- සම්ප්‍රදාන විභක්තිය
(ii) ජනාධිපතිතුමනි - ආලපන විභක්තිය, රාජ්‍ය සේවකයන්ගේ - සම්බන්ධ විභක්තිය
(iii) මලින් - අවධි විභක්තිය, වනබඹරුන් - ආධාර විභක්තිය

(ඊ) (i) 'කලිකාල, සාහිත්‍යය, සර්වඥ, පණ්ඩිත' යනුවෙන් දෙවන පරාක්‍රමබාහු රජතුමා හැඳින් වූ ගෞරව නාමය වේ.
(ii) 'අහෝ! මෙවන් විපතක් සිදුවූයේ ඇයි'? යනුවෙන් අම්මා කීවාය.
(iii) '70-80 දශකය මෙරට සුභාවිතගීත සාහිත්‍ය මැනවින් පෝෂණය වූ කාලයක් බව' විචාරකයෙක් පැවසීය.



NWP EXAM

(උ) (i) තමාට දෙවියන්ගේ පිහිට ලැබෙන බව දර්ශනී කීවාය.

(ii) මීට දෙසතියකට පෙර අප එතැනට ගිය බව නිමල් කීවේය.

(iii) තමන් පසුදින පාසලට යන බව ඔවුහු කීහ.

07. (i) ඓතිහාසික, තාක්ෂණය, බෞද්ධයෝ, මූලාරම්භය, විද්‍යාත්මක, විශේෂ, විශ්වාස

(ii) තොරතුරු - කොම්බුව, ඇලපිල්ල, කෙටි පාපිල්ල, කෙටි පාපිල්ල.
සත්ත්වයා - හල් කිරීම/කොඩිය, හල් කිරීම, ඇලපිල්ල.
බෞද්ධ - කොම්බුව, ගයනුකිත්ත, හල්කිරීම/කොඩිය

(iii) 1. ඓතිහාසික 2. මූලාරම්භය/දෙවියන්/මානවයා/පර්යේෂණ/රටවල
3. නිරීක්ෂණය/තාක්ෂණය

(iv)

| | | |
|---|---|---|
| 1. මූල + ආරම්භය | 2. නිර්+ ඊක්ෂණ | 3. මිනිස් + ආ |
| මූල් + ආ + ආරම්භය | නිරීක්ෂණ | මිනිසා |
| මූලාරම්භය | ස්වර සන්ධිය | ස්වර සන්ධිය |
| පූර්ව ස්වර ලෝප සන්ධිය | | |

(v) 1. කරති 2. තබා 3. පවසයි

08. (i) **පර රූ සඳ**
සන්ධිවන පද දෙකෙන් පසු පදයේ මුල ව්‍යඤ්ජනයේ රූපය පෙර පදයේ අග ව්‍යඤ්ජනයට පැමිණීමෙන් ගැළපෙන සන්ධියයි.

උදාහරණ : ලිප් + ගල — ලිග් + ගල — ලිග්ගල
අත් + සන — අත් + සන — අස්සන

(ii) **ඝෝෂ අක්ෂර**
පෙණහැල්ලේ සිට මුඛය දක්වා පැමිණෙන වායු ධාරාව උගුරෙහි වූ ඝෝෂ තන්තු ස්පන්දනය වීම නිසා ශබ්ද උච්චාරණයේදී ඝෝෂයක් හටගන්නා ශබ්දයි. මේ සඳහා සියලුම ස්වරත් වර්ගාක්ෂරවල තුන්වන, හතරවන හා පස්වන අකුරුත් අන්තඃස්ථාක්ෂර හතරක් හ, ළ, (අ)ං අක්ෂරයත් අයත්ය.

(iii) **අවධි විභක්ති සමාසය**
අවධි විභක්ති අර්ථය දෙන පදයක් පෙර පදය ලෙස යෙදී පසුව පිටි නාමය සමග එක්ව සෑදෙන සමාසයයි.

උදාහරණ : ඇසෙන් එන වහ → ඇස්වහ
මිහියෙන් නගින දුම් → මිහිදුම්

(iv) **<u>අසම්භාව්‍ය ක්‍රියා :</u>**
යම් ක්‍රියාවකින් කාලාර්ථයක් හෝ අවිනිශ්චිත බවක් හැඟවේනම් එම ක්‍රියා අසම්භාව්‍ය ක්‍රියා වේ. මෙය වර්ග 2කි.

1. කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා 2. අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා

කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා යනු ක්‍රියා පදයෙන් කාලය හැඟවීමයි.
උදා : කුකුළන් හඬලද්දී මම අවදි වුනෙමි.
අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියායනුක්‍රියාවෙහි නිශ්චිත බවක් නොවීමයි.
උදා : වැසි වැස්සොත් ගඟ පිරෙයි.

(v) භාව කෘදන්ත :
කර්තෘ හෝ කර්ම අර්ථයක් නොමැති, ක්‍රියා මාත්‍රය පමණක් හඟවන නාම භාව කාරක කෘදන්ත වේ.
නු , උම්, ඊම්, ඉලි, මන් යන ප්‍රත්‍ය මෙහි යෙදේ.
නු - ලිය + නු - ලියනු
උම් - බල + උම් - බැලුම්
ඊම් - බල + ඊම් - බැලීම්
ඉලි - බල + ඉලි - බැලිලි
මන් - ලිය + මන් - ලියමන්

NWP - EXAM